# (උ) මිල සහ වැටුප්

## (අ) මිල

පාරිභෝගික මිල දර්ශකයෙන් පෙන්නුම් කළ පරිදි, 1970 මිල සියයට 5·9 කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, ඉහළ නැගීම ඉකුත් වර්ෂයට වඩා අඩු විය. ගතවූ වසර තුන සඳහා මිල දර්ශකයේ සාමාන්‍ය වැඩිවීම දළ වශයෙන් සියයට 5 ක්ව පැවතිණ. වර්ග කීපයකම, ආහාර, ඉන්ධන හා එළිය සහ විවිධ ගණයන්හි මිල සැළකිය යුතු පරිදි වැඩිවීමක් පැවතියේය. පරිපාලනමය, පාලනයකින් නිදහස්ව පැවති, සමහර භාණ්ඩ සහ සේවා ගණයන් සම්බන්ධයෙන් මෙම මිල වැඩිවීම් ඇති විය. බොහෝ දෑ සම්බන්ධයෙන් මිල වැඩිවීමට, දේශීය මෙන්ම ආනයන සැපයුම බලපෑමක් කළ බව පෙණුනි. සමහර දෑ සම්බන්ධයෙන් ව්‍යාපාර පරිවැටුම් බදු පැනවීම මිල ඉහළ යාමට හේතු විය. සැපයුම බොහෝ විට අනම්‍යව පවතින, පසුබිමක ඉල්ලුමේ බලපෑම, මිල වඩාත් තියුණු ලෙස ඉහළ නැංවීමට බල කෙරේ. කෙසේ වෙතත්, වසරේ අවසාන භාගයේදී හඳුන්වා දෙන ලද මිල පාලන උපක්‍රම මගින් යම්කිසි යහපත් තත්ත්වයක් ඇතිවූ බව පෙනුණද, එය බලපෑවේ, සීමිත ද්‍රව්‍ය ගණනකට පමණි.

සාමාන්‍ය මිල මට්ටම කෙරෙහි බලපානු ලබන තවත් වැදගත් සාධකයකි වැටුප්. වැටුප් නිෂ්පාදන වියදම් වලින් සැළකිය යුතු කොටසකට වග කියන අතර, නිමැවුමට වඩා වේගයෙන් එය ඉහළ යන කළ, ප්‍රතිඵලය වනුයේ, ඒකක නිෂ්පාදන වියදම් ඉහළ යාමයි. නිෂ්පාදකයන් ඉහළ යාම බාර ගතහොත් විනා, මේ පැවැත්ම, මිල කෙරෙහි සෘජු බලපෑමක් කරනු ලබයි. 1970 වර්ෂය තුළදී, කාර්මික හා කෘෂිකාර්මික අංශයන්හි වැටුප් වැඩිවීම් කීපයක්ම විය. මෙය අනික් අතට, මිල ඉහලයාම කෙරෙහි කිසියම් බලපෑමක් ඇති කළේය.

දැනටමත් සඳහන් කළ සාධකයනට අමතරව, මූල්‍ය ප්‍රසාරණ අනුපාතයද මිල ඉහළ නැංවීමට ඉවහල් විය. 1970 මුදල් සැපයුමේ මාසික සාමාන්‍ය මට්ටම ඉකුත් වසරට වඩා සියයට 4·0 කින් වැඩි විය.

### 1. කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය

1969 සියයට 7·4 ක වැඩිවීම හා සසඳන කල 1970 ජීවන වියදම් දර්ශකය සියයට 5·9 කින් වැඩි විය. මුළු දර්ශකය කෙරේ වැඩි බලපෑමක් ඇති ආහාර දර්ශකය සියයට 6·8 කින්ද, රෙදිපිළි සියයට 4·9 කින්ද, ඉන්ධන හා එළිය සියයට 9 කින්ද, ගෙවල් කුලී සියයට 1·3 කින්ද, විවිධ ශීර්ෂ සියයට 4·1 කින්ද ඉහළ ගියේය. 1969 අනුරූප වැඩිවීම පිළිවෙලින් සියයට 5·5, 9·0, 21·0, 6·8 සහ 10·1 ක් විය.

1970 දී, අබ සහ ගම්මිරිස් මිල සියයට 100 ද ඉක්මවා ඉහළ යෑම් වාර්තා විය. සුදුළූණු හා වියලි ඉඟුරු සම්බන්ධයෙන් මිල ඉහළ යෑම් පිළිවෙලින් සියයට 64 සහ සියයට 87 ක් විය. පහත සඳහන් ද්‍රව්‍යයන්හි මිල සියයට 20 කින් පමණ වාගේ ඉහළ ගියේය. එනම්:– තුනපහ, වියළි මිරිස්, කහ, සුදුරු සහ කරවල, විනාකිරි, කුළුබඩු, සියඹලා, එළවළු හා පළතුරු, හරක් මස්, එළු මස්, අළුත් මාලු, පපඩම් සහ දර සම්බන්ධයෙන් සැළකිය යුතු වැඩිවීමක් (සියයට 10 ට වැඩි) වාර්තා විය. ඇට වර්ග, උකුකළ කිරි, කිරි පිටි, රතුළූණු, බොම්බයි ළූණු, බටර් සහ දේශීය ජෑම්වල සුළු මිල වැඩිවීමක් (සියයට 5 කට වැඩි) විය. ආහාර ද්‍රව්‍ය ගණනාවකම මිල වැඩිවීමට සැපයුම් සාධක ඉවහල් වූ බව පෙනී යයි.

මිල පහළ යෑම් සාපේක්ෂකව විරළ වන අතර, පහළ යෑම්වල බලපැවැත්මද සාපේක්ෂකව නොපෙනෙන තරම් විය. 1970 දී මිල පහළ යෑම් වාර්තාවූ ද්‍රව්‍ය මෙසේය; තේ, මහදුරු, කේජු, කමිස රෙදි, සරොන්, අමු රෙදි, බැනියන්, සිල්ක් වර්ග, තුවා සහ ගෘහභාවිත රෙදි.

1969 සියයට 9 වැඩිවීම හා සලකන කළ රෙදිපිළි පිළිබඳ දර්ශකය සියයට 4·9 කින් වැඩි විය. සුදු රෙදිවල මිළ ඉහළ යෑම මීට ප්‍රධාන වශයෙන්ම හේතු විය. කෙසේ වෙතත්, 1970 වර්ෂය තුළදී සමහර රෙදි වර්ගවල සුළු මිල අඩුවීම් ඇති විය.

## II (ඌ) 1 සංඛ්‍යා සටහන

## කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය

(පාදය 1952 = 100)

| වර්ෂය | සියළුම ශීර්ෂ | භාණ්ඩ අනුව | | | | | ගණ අනුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ආහාර | රෙදිපිළි | ඉන්ධන හා එළිය | ගෙවල් කුලී | විවිධ | දේශීය ගණය | ආනයන ගණය | අපනයන ගණය |
| බර | 100·0 | 61·9 | 9·4 | 4·3 | 5·7 | 18·7 | 60·0 | 35·0 | 5·0 |
| 1966 සාමාන්‍යය | 112·3 | 109·1 | 117·0 | 95·9 | 101·5 | 127·3 | 116·8 | 105·4 | 127·6 |
| 1967 සාමාන්‍යය | 114·8 | 112·7 | 116·7 | 96·5 | 101·5 | 128·9 | 117·1 | 111·2 | 123·9 |
| 1968 සාමාන්‍යය | 121·5 | 121·2 | 120·1 | 103·2 | 101·5 | 133·6 | 123·2 | 117·3 | 142·4 |
| **1969** | | | | | | | | | |
| 1 වන කාර්තුව | 127·7 | 125·3 | 129·5 | 118·6 | 104·3 | 143·9 | 130·1 | 121·0 | 159·8 |
| 2 වන කාර්තුව | 129·8 | 127·3 | 130·5 | 122·3 | 109·8 | 145·8 | 133·8 | 122·2 | 150·5 |
| 3 වන කාර්තුව | 130·4 | 126·8 | 130·8 | 129·4 | 109·8 | 148·7 | 135·1 | 123·7 | 132·5 |
| 4 වන කාර්තුව | 134·2 | 132·2 | 132·6 | 129·4 | 109·8 | 150·0 | 138·0 | 127·3 | 150·1 |
| සාමාන්‍යය | 130·5 | 127·9 | 130·9 | 124·9 | 108·4 | 147·1 | 134·2 | 123·6 | 148·2 |
| **1970** | | | | | | | | | |
| 1 වන කාර්තුව | 137·3 | 136·5 | 134·4 | 129·4 | 109·8 | 151·8 | 140·2 | 129·3 | 175·6 |
| 2 වන කාර්තුව | 138·5 | 137·0 | 137·0 | 138·3 | 109·8 | 153·2 | 144·3 | 128·8 | 150·7 |
| 3 වන කාර්තුව | 137·8 | 135·5 | 138·7 | 138·3 | 109·8 | 153·6 | 143·0 | 129·7 | 144·4 |
| 4 වන කාර්තුව | 139·1 | 137·2 | 139·0 | 138·3 | 109·8 | 154·4 | 144·2 | 129·5 | 158·5 |
| සාමාන්‍යය | 138·2 | 136 6 | 137·3 | 136·1 | 109·8 | 153·2 | 142·9 | 129·3 | 157·3 |
| 1969 ට වඩා 1970 ඉහළ නැගුණු සියයට ගණන | 5·9 | 6·8 | 4·9 | 9·0 | 1·3 | 4·1 | 6·5 | 4·6 | 6·1 |

මූලය: සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව.

ඉතුත් වසරේ වූ සියයට 21 ක වැඩිවීම හා සලකන කළ 1970 දී ඉන්ධන හා එළිය සඳහා වන දර්ශකය සියයට 9 කින් ඉහළ ගියේය, දර්ශකයේ ඉහළ නැගෙන උපනතිය ප්‍රධාන වශයෙන්ම පිළිබිඹු කරනුයේ වසර තුළදී, දරවල මිලෙහි වඩාත් තියුණු වැඩිවීම මගිනි.

1969 දී සියයට 6·8 හා සලකන කළ 1970 දී ගෙවල් කුලී සඳහා වන දර්ශකය සියයට 1·3 කින් ඉහළ ගියේය. විමර්ශනයට භාජිත වසරේ ගෙවල් කුලී පිළිබඳ කිසියම් ස්ථායිකරණයක් පැවතීම මීට හේතු විය.

ඉකුත් වසර හා සසඳන කළ 1970 විවිධ ද්‍රව්‍ය වර්ග පිළිබඳ දර්ශකයේ වැඩිවීම, තියුණුකමින් අඩුය, මීට අමතරව, මෙම ගණයේ මිල වැඩිවීම්වලට ප්‍රධාන හේතුව වශයෙන් පෙනෙන්නේ, ව්‍යාපාර පිරිවැටුම් බදුවල වැඩිවීමයි. කෙසේ වෙතත්, 1970 පසු භාගයේදී යොදවනු ලැබූ මිල පාලනයන්, සමහර වර්ගවල මිළ අඩු කිරීමට ඉවහල් විය. (උදහරණ - පවිත්‍රෝපකරණ, බෙහෙත් ද්‍රව්‍ය, බයිසිකල් ටයර් හා ටියුබ්, අධ්‍යාපනික ලිපි ද්‍රව්‍ය) එමගින් සමස්තව, වසර සඳහා සාමාන්‍ය මිල වැඩිවීම් හීන කෙරුණි.

### 2. පාරිභෝගික මිල දර්ශකයෙන් පරිබාහිර මිල ගණන්

පාරිභෝගික මිල දර්ශකයෙහි ඇතුලත් නොකරන ලද සීමිත ද්‍රව්‍ය ගණනාවක මිල ගණන් පිළිබඳ සංඛ්‍යා තොරතුරු ලබා ගන්නා ලද්දේ, ප්‍රකාශිත මිල ලැයිස්තුවලින් සහ කොළඹ නගරයේ සිල්ලර වෙළඳුන්ගෙන් කෙළින්ම විමසීමෙනි. මෙම ද්‍රව්‍යයන් පාරිභෝගික, අන්තර් සහ ආයෝජන භාණ්ඩ වශයෙන් පුළුල්ව වර්ග කොට ඇත.

1969 අවසානය හා 1970 අවසානය අතර තෝරා ගන්නා ලද ද්‍රව්‍ය කීපයක මිල ගණන් වල සියයට ගණනේ වෙනස්වීම් පහත දැක්වෙන සංඛ්‍යා සටහන පෙන්වයි.

## II (ඌ) 2 සංඛ්‍යා සටහන
## පාරිභෝගික මිල දර්ශකයෙන්* බාහිර මිල

| ද්‍රව්‍යයේ ස්වභාවය | 1970/1969 සියයට ගණනේ වෙනස |
|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | |
| සපත්තු | — 12 |
| මහන මැෂින් | — 4 |
| දන්තාලේප | — 18 – 22 |
| කුඩ | — 17 – 28 |
| විදුලිපන්දම් හා ට්‍රාන්සිස්ටර් බැටරි | — 12 – 16 |
| කමිස | — 15 – 29 |
| ගල්ලෑලි | — 5 – 20 |
| ගණිත උපකරණ පෙට්ටි | — 15 |
| කාබන් කොළ | + 30 |
| මෝටර් රථ අමතර කොටස් | + 6 – 30 |
| කපු නූල් | + 22 |
| **අන්තර් භාණ්ඩ** | |
| පොහොර | + 3 – 27 |
| තඹ වයර් | + 15 |
| සෝඩා අළු | + 13 |
| පී. වී. සී. මිශ්‍රණ | + 10 |
| **ආයෝජන භාණ්ඩ** | |
| තේ යන්ත්‍ර උපකරණ | + 21 – 35 |
| ඇඹරුම් යන්ත්‍ර | + 7 |
| විදුලි සහ කේබල් | + 7 – 24 |
| පදම් නොකළ වානේ | + 12 |
| මැටි උළු | + 9 – 20 |
| තුනී ලෑලි | + 2 – 17 |

* ද්‍රව්‍යයන් ඉදිරියෙන් දක්වා ඇති සියයට ගණන් වැඩිවීම අන්තරය, නියෝජිත ද්‍රව්‍යයන්හි අඩුම හා ඉහළම සියයට ගණන් වැඩිවීම නිරූපණය කරයි.

### 3. පාරිභෝගික භාණ්ඩ

තම්බපු සහල් සඳහා කොළඹ විවෘත වෙළඳ පොලේ වාර්ෂික සාමාන්‍ය මිල 1969 ට වඩා 1970 වසරේදී සියයට 3 කට ආසන්න පහළ යාමක් වාර්තා කළේය. 1970 මුල් භාගයේදී සාමාන්‍ය මිල 1969 ඊට අනුරූප කාල සීමාවට වඩා සියයට 5 ක වැඩිවීමක් වුවද, 1970 පසු භාගයේදී සාමාන්‍ය මිල, 1969 ඊට අනුරූපී කාල සීමාවට වඩා සියයට 6 ක පහළ යාමක් වාර්තා කළේය.

සපත්තු සහ මහන මැෂින්වල මිල පහළ යෑම් සිදුවුන අතර, කාබන් කොළ, මෝටර් රථ අමතර කොටස් සහ කපුනූල් මිල ගණන්වල ඉහළ යෑම් සිදුවිය.

### මිල පාලනය

1970 සැප්තැම්බර් 30, 1970 ඔක්තෝබර් 21 සහ 1970 දෙසැම්බර් 11 යන දිනයන්හි, ලංකා ආණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ මිල පාලන නියෝගයන් අනුව පහත දැක්වෙන ද්‍රව්‍යයන්හි මිල අඩු කෙරුණි. එනම්:- දන්තාලේප, විදුලි පන්දම් සහ ට්‍රාන්සිස්ටර් බැටරි, කුඩ, කමිස, ගල්ලෑලි සහ ගණිත උපකරණ පෙට්ටි.

### 4. අන්තර් භාණ්ඩ

පොහොර මිලෙහි සියයට 3 සිට සියයට 27 දක්වා වෙනස් වන මිල ඉහළ යෑම් වාර්තාවූ අතර, තඹ වයර්, සෝඩා අළු සහ පී·වී·සී· මිශ්‍රණ පිළිවෙලින් සියයට 15, සියයට 13 සහ සියයට 10 වශයෙන් ඉහළ ගියේය.

### 5. ආයෝජන භාණ්ඩ

පදම් නොකළ වානේ සහ ඇඹරුම් යන්ත්‍රවල මිල පිළිවෙලින් සියයට 12 ක් සහ සියයට 7 බැගින් වැඩි විය. තේ යන්ත්‍ර උපකරණ, විදුලි සහ කේබල්, මැටි උළු සහ තුනී ලැලිවල වාර්තාවූ මිල වැඩිවීම් පිළිවෙලින් සියයට 21 සිට 35, සියයට 7 සිට 24, සියයට 9 සිට 20 සහ සියයට 2 සිට 17 අතර ප්‍රමාණයන්හි වෙනස් විය.

### (ආ) වැටුප්

රාජ්‍ය අංශයේ කාර්මික හා ලිපිකාර සේවකයන්, සුළු සේවකයන් සහ පාසැල් ගුරුවරුන් සඳහා මහ බැංකුව වැටුප් අනුපාතික දර්ශක පිළියෙල කරන්නීය. ඒවා, නියෝජන කොටස් වලට ගෙවනු ලබන මූලික වේතන හා වැටුප් සහ දීමනාවන්ගෙන් ගණනය කරනු ලබන අතර, එයට වාර්ෂික වේතන වැඩිවීම් සහ අතිකාල දීමනා අඩංගු නොවේ. පෞද්ගලික අංශයේ, වැටුප් පාලක සභාවල පාලනයට නතුවන කෘෂිකර්ම, කර්මාන්ත සහ වාණිජ කටයුතුවල නියුතු කම්කරුවන් සඳහා වැටුප් අනුපාතික දර්ශක, කම්කරු දෙපාර්තමේන්තුව මගින් ප්‍රසිද්ධ කරනු ලබයි. 1967 දෙසැම්බර් මස සිට අවප්‍රමාණ දීමනාවන්ද ඇතුළත්ව, මේවා වැටුප් පාලක සභා මගින් නියමිත අවම වැටුප් අනුපාතිකයන් අනුව පදනම් වී ඇත. මෙම දර්ශක අංක සඳහා පදනම් කාල සීමාව වන්නේ 1952 වර්ෂයයි.

ඉහත සඳහන් වැටුප් අනුපාතික දර්ශකයන්හි, නියම ඉපයුම්, එනම්, ඇතුළත් විය යුතුව තිබුණ, අතිකාල දීමනා සහ පුද්ගලික අංශයේ සේවකයන් සම්බන්ධයෙන් මූලික හෝ ප්‍රසාද දීමනා වැනි විශේෂ ගෙවීම් හෝ නියෝජනය නොවේ. වැටුප් අනුපාතික දර්ශක, ජීවන වියදම් දර්ශකයෙන් (කොළඹ පාරිභෝගික මිල දර්ශකය) අවධමනය කිරීමෙන් මහ බැංකුව විසින් මූර්තවැටුප් අනුපාතික දර්ශකයන් ගණනය කරනු ලැබේ.

පහත දැක්වෙන සංඛ්‍යා සටහන 1969 සහ 1970 වසරවල රජයේ සේවකයන් සඳහා වාර්ෂික හා ත්‍රෛමාසික වැටුප් අනුපාතික හා මූර්ත වැටුප් අනුපාතික දර්ශක අංකයන් පෙන්වයි.

**II (ඖ) 3 සංඛ්‍යා සටහන**

**රජයේ සේවකයන්ගේ වැටුප් අනුපාතික දර්ශක අංක**

**(1952 = 100)**

| | කාර්මික හාලිපිකාර ශස්වකයන් | | සුළු සේවකයන් | | රජයේ සේවකයන් (අ) | | රජයේ පාසැල් ගුරුවරුන් | |
|---|---|---|---|---|---|---|---|---|
| | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය |
| **1969** | | | | | | | | |
| පළමු කාර්තුව .. | 140·1 | 109·7 | 163·0 | 127·6 | 152·6 | 119·5 | 129·6 | 101·5 |
| දෙවන කාර්තුව .. | 140·1 | 107·9 | 163 0 | 125·5 | 152·6 | 117·5 | 129·6 | 99·8 |
| තුන්වන කාර්තුව .. | 140·1 | 107·5 | 163·0 | 125·0 | 152·6 | 117·0 | 129·6 | 99·4 |
| සතරවන කාර්තුව .. | 157·2 | 117·2 | 182·9 | 136·3 | 171·3 | 127·7 | 141·1 | 105·2 |
| සාමාන්‍යය .. | **144·4** | **110·6** | **168·0** | **128·6** | **157·3** | **120·4** | **132·5** | **101·5** |
| **1970** | | | | | | | | |
| පළමු කාර්තුව .. | 157·2 | 114·5 | 182·9 | 133·2 | 171·3 | 124·7 | 141·1 | 102·7 |
| දෙවන කාර්තුව .. | 157·2 | 113·5 | 182·9 | 132·1 | 171·3 | 123·7 | 141·1 | 101·9 |
| තුන්වන කාර්තුව .. | 157·2 | 114·1 | 182·9 | 132·7 | 171·3 | 124·3 | 141·1 | 102·4 |
| සතරවන කාර්තුව .. | 157·2 | 113·0 | 182·9 | 131·5 | 171·3 | 123·2 | 141·1 | 101·4 |
| සාමාන්‍යය .. | **157·2** | **113·8** | **182·9** | **132·4** | **171·3** | **124·0** | **141·1** | **102·1** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) ලිපිකාර හා කාර්මික සහ සුළු සේවකයන් සඳහා වූ ඒකාබද්ධ දර්ශකය.

සටහන: 1959 සැප්තැම්බර් 30 වැනිදට සේවයෙහි යෙදී සිටි සේවකයින් ප්‍රමාණය මත පදනම්වූ, නිශ්චිත බර තැබීම් අනුව මෙම දර්ශකාංකයන් ගණනය කර ඇත. දර්ශකාංකයන් ගණනය කිරීමේදී යොදගෙන ඇති වැටුප් අනුපාතිකයන් වනුයේ, එක් එක් නියෝජන පරිමාවෙහි වූ මූලික වැටුප් සහ දීමනාවන්ය.

1969 වැටුප් සහ සේවා කොමිෂම නිර්දේශ කල පරිදි, 1969 ඔක්තෝම්බර් මස සිට ඒකාබද්ධ වැටුප් ගෙවීමෙන් ආරම්භව, 1970 වසර තුළදී වැටුප් අනුපාතිකයන් ස්ථාවරව පැවතුණි. ශිල්පී හා ලිපිකාර සේවකයන් සඳහා 157·2 ද, සුළු සේවකයන් සඳහා 182·9 ද, පාසැල් ගුරුවරුන් සඳහා 141·1 ද වැටුප් අනුපාතික දර්ශකයන් පැවතියේය. 1969 හා සසඳන කල, ශිල්පී හා ලිපිකාර සේවකයන් සහ සුළු සේවකයන් සඳහා සියයට 8·9 ක ද, පාසැල් ගුරුවරුන් සඳහා සියයට 6·5 ක ද වැඩිවීමක් වැටුප් අනුපාතික දර්ශකයෙහි වාර්තා විය.

1970 අවසාන කාර්තුවෙහි හැර 1970 රජයේ සේවකයන් සඳහා වූ ත්‍රෛමාසික මූර්ත වැටුප් අනුපාතික දර්ශකයන්, 1969 අනු පිළිවෙළින් වූ ත්‍රෛමාසික දර්ශකයන්ට වඩා ඉහළින් පැවතියේය. 1969 ඔක්තෝම්බර් සිට ඒකාබද්ධ වැටුප් ගෙවීමේ ප්‍රතිඵලයක් වශයෙන්, 1969 අවසාන කාර්තුව සඳහා මූර්ත වැටුප් අනුපාතික දර්ශකය සැලකිය යුතු පරිදි ඉහළ ගියේය. කෙසේ වෙතත්, 1969 අවසාන කාර්තුවෙහි අනුරූප දර්ශකයන් හා සසඳන කල 1970 අවසාන කාර්තුවේ රජයේ සේවකයන් සහ රජයේ පාසල් ගුරුවරුන් සඳහා වූ මූර්ත වැටුප් අනුපාතික දර්ශකයන් පිළිවෙලින් සියයට 3·5 කින් සහ 3·6 කින් පහත වැටුනි. රජයේ සේවකයන් සහ රජයේ පාසල් ගුරුවරුන්ගේ සාමාන්‍ය වාර්ෂික මූර්ත වැටුප් අනුපාතික දර්ශකය 1969 ට වඩා 1970 දී ඉහළින් පැවතිණ. ශිල්පී හා ලිපිකාර සේවකයන් සඳහාවූ මූර්ත වැටුප් අනුපාතික සාමාන්‍ය දර්ශකය සියයට 2·9 කින් වැඩි විය. 1970 දී සුළු සේවක ගණයේ වැඩිවීම සියයට 3·0 ක් වූ අතර, රජයේ පාසල් ගුරුවරුන්ගේ වැඩිවීම සියයට 0·6 විය. 1969 සහ 1970 දී පෞද්ගලික අංශයේ සමහර වැටුප් පාලක සභා යටතට පත්වූ සේවකයන් සඳහා පැවති වාර්ෂික සහ ත්‍රෛමාසික අවම වැටුප් අනුපාතික දර්ශක අංකයන් පහත දැක්වෙන සංඛ්‍යා සටහන පෙන්වයි.

## II (ඌ) 4 සංඛ්‍යා සටහන

## වැටුප් පාලක සභා කර්මාන්තයන්හි කම්කරුවන්ගේ අවම වැටුප් අනුපාතික දර්ශක අංක. 1952 = 100

| | කෘෂිකර්මයෙහි නියුතු කම්කරුවෝ (අ) | | කර්මාන්ත සහ වානිජ අංශවල නියුතු කම්කරුවෝ (ආ) | | වැටුප් පාලක සභා කර්මාන්තවල නියුතු කම්කරුවෝ (ඇ) | |
|---|---|---|---|---|---|---|
| | අවම වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | අවම වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | අවම වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය |
| 1969 පළමු කාර්තුව .. | 138·8 | 108·7 | 161·6 | 126·6 | 141·2 | 110·6 |
| දෙවන කාර්තුව .. | 138·8 | 106·9 | 161·6 | 124·5 | 141·2 | 108·7 |
| තෙවන කාර්තුව .. | 138·8 | 106·4 | 161·6 | 124·0 | 141·2 | 108·3 |
| සතරවන කාර්තුව .. | 138·8 | 103·4 | 161·8 | 120·6 | 141·2 | 105·2 |
| සාමාන්‍යය .. | 138·8 | 106·3 | 161·7 | 123·9 | 141·2 | 108·2 |
| 1970 පළමු කාර්තුව .. | 139·8 | 101·8 | 162·2 | 118·1 | 142·2 | 103·5 |
| දෙවන කාර්තුව .. | 140·3 | 101·3 | 162·3 | 117·2 | 142·7 | 103·0 |
| තෙවන කාර්තුව .. | 140·3 | 101·8 | 165·5 | 120·1 | 143·0 | 103·7 |
| සතරවන කාර්තුව .. | 140·5 | 101·0 | 174·2 | 125·2 | 144·0 | 103·5 |
| සාමාන්‍යය .. | 140·2 | 101·5 | 166·1 | 120·2 | 142·9 | 103·4 |

මූලය: කම්කරු දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) තේ වගාව හා නිෂ්පාදනය, රබර් වගාව හා නිෂ්පාදනය සහ පොල් වගා කර්මාන්ත පමණක් අඩංගු වේ.

(ආ) පොල් නිෂ්පාදනය, ඉංජිනේරු, මුද්‍රණ කටයුතු, ගිනිපෙට්ටි නිෂ්පාදනය, මෝටර් රථ ප්‍රවාහනය, නැව් තටාක, වරාය, වරාය ප්‍රවාහණය, තේ නිර්යාත, රබර් නිර්යාත, චිත්‍රපට සහ ගොඩනැගිලි කර්මාන්තයන් පමණක් අඩංගු වේ.

(ඇ) කෘෂිකාර්මික කම්කරුවන් සහ වාණිජ හා කාර්මික කම්කරුවන් සඳහා වූ ඒකාබද්ධ දර්ශකය.

1970 දී පුද්ගලික අංශයේ සේවකයන්ගේ ත්‍රෛමාසික හා වාර්ෂික සාමාන්‍ය වැටුප් අනුපාතික දර්ශකයන් ඉකුත් වසරට වඩා වැඩිවිය. 1970 දී 140·2 දක්වා ඉහල ගිය, කෘෂිකර්මයේ නියුතු කම්කරුවන්ගේ සාමාන්‍ය වාර්ෂික වැටුප් අනුපාතික දර්ශකය, සියයට 1·0 ක වැඩිවීමක් වාර්තා කළේය. කර්මාන්ත හා වාණිජ කටයුතුවල නියැලි කම්කරුවන්ගේ සාමාන්‍ය වැටුප් අනුපාතික දර්ශකය 1969 දී 161·7 සිට 1970 දී 166·1 දක්වා සියයට 2·7 කින් වැඩි විය.

1968 අංක 40 දරන සේවක අවප්‍රමාණ අතුරු දීමනා ආඥා පනතේ[1], 4 (1) වගන්තිය අනුව, ඉහළ දීමනා ගෙවීමේ ප්‍රතිඵලයක් වශයෙන්, 1970 පළමු කාර්තුව තුළදී කෘෂිකර්ම, කර්මාන්ත සහ වාණිජ කටයුතුවල නියුතු කම්කරුවන්ගේ වැටුප් අනුපාතික දර්ශකයන් පිළිවෙලින් 139·8 සහ 162·2 දක්වා ඉහළ ගියේය. 1970 තෙවන කාර්තුවේදී, කර්මාන්ත සහ වාණිජ කටයුතුවල නියැලි කම්කරුවන්ගේ සාමාන්‍ය වැටුප් අනුපාතික දර්ශක, දෙවන කාර්තුවේ වූ 162·3 සිට සියයට 2·0 ක වැඩිවීමක් වාර්තා කරමින් 165·5 දක්වා වැඩි විය. මෙයට හේතු වූයේ 1970 සැප්තැම්බර් 1 ද සිට ඉංජිනේරු කර්මාන්තයෙහි සියළුම කම්කරුවන්ට දිනකට රු. 1·35 ක අවම ඒකාබද්ධ වැටුප් වැඩිවීමක් ගෙවීමයි. සතරවන කාර්තුවේදී, කෘෂිකාර්මික කම්කරුවන් සඳහා වූ සාමාන්‍ය වැටුප් අනුපාතික දර්ශකය 140·3 සිට 140·5 දක්වා සියයට 0·1 කින් වැඩි වූ අතර, කර්මාන්ත හා වාණිජ කටයුතුවල නියුතු කම්කරුවන් සඳහා වූ සාමාන්‍ය දර්ශකය 165·5 සිට 174·2 දක්වා හෝ සියයට 5·3 කින් වැඩි විය. මෙම වැඩිවීම, වැවිලි කර්මාන්තයන්හි කම්කරුවන්ට ගෙවන ලද වැඩි දීමනා වල සහ 1970 නොවැම්බර් 1 ද සිට තේ නිර්යාත කර්මාන්තයෙහි සියළුම වර්ගවල කම්කරුවන්ට දිනකට රු: 1·35 ක අවම ඒකාබද්ධ වැටුප් වැඩි කිරීමේ ප්‍රතිඵලය විය.

1970 දී වාර්ෂික සාමාන්‍ය මූර්ත වැටුප් අනුපාතික දර්ශකය ඉකුත් වසරේ දර්ශකයට වඩා අඩු විය. 1970 දී කෘෂිකාර්මික කම්කරුවන් සඳහා වූ සාමාන්‍ය දර්ශකය සියයට 4·5 කින් 106·3 සිට 101·3 දක්වා පහත වැටුන අතර, කර්මාන්ත හා වාණිජ කම්කරුවන් සඳහා වූ සාමාන්‍ය දර්ශකය සියයට 3·0 කින් 123·9 සිට 120·2 දක්වා අඩු විය.

1970 ජුනි මස පළමුවැනි දින සිට මද්‍යසාර හා විනාකිරි කර්මාන්තයන් හා සම්බන්ධ, එක් කලකදී, නිෂ්පාදන ඒකක ප්‍රමාණය අනුව ගෙවනු ලැබූ කම්කරුවන්ට දෙන ලද මූලික වැටුප් වැඩි වූ අතර, 1970 ඔක්තෝබර් 1 දින සිට පොල් වගා කර්මාන්තයේ කොන්දෙස්තරවරුනට අදළ අවම ඒකාබද්ධ වැටුප රුපියල් 25 කින් වැඩි විය.

1970 දෙසැම්බර් 1 දින පටන් කොටුව හා පිටකොටුව ප්‍රදේශවල සාප්පු 257 ක සේවකයන් හට ගෙවනු ලබන අවම වැටුප් අනුපාතිකයන්, සාප්පු හා කාර්යාල සේවක ආඥා පණත යටතේ, වැටුප් මණ්ඩලයකින් නියම විය.

රාජාසන කථාවේ සඳහන් කළ යෝජනා ක්‍රියාත්මක කිරීමට වාර්තා කිරීම සඳහා විමසුම් කමිටුවක් රජය විසින් පත්කරන ලදී. සමාන වැඩට සමාන වැටුප්, ප්‍රසාද දීමනා, සේ. අ. අ. දායක දීමනා වැඩි කිරීම, විශේෂයෙන් ගෘහ කර්මාන්ත සහ අසාධාරණ වැටුප් ගෙවන ගැහැණු සේවකයන්ගේ ඌන ගෙවීම් අවලංගු කිරීම යනාදිය ඇතුළත්ව කම්කරු අයිතීන් ප්‍රඥප්තියක් පිළිබඳව කමිටුව සැළකිලිමත් වනු ඇත. නීතිගත මණ්ඩල සහ සංස්ථාවල සේවා කොන්දේසි හා තත්ත්වයන්ට අදළ කරුණු ගැන විමසීමට ඔක්තෝබර් මාසයේදී කැබිනට් අනු කාරක සභාවක් පත්කරන ලදී.

---

1 මෙම ආඥා පනත යටතේ සේවකයින් වෙත, අවප්‍රමාණ දීමනාවන් ඇතුළු ජීවන වියදම් දීමනාවක් හෝ 1967 දෙසැම්බරයෙහි වටිනාකම් අනුව විශේෂ දීමනාවක් හෝ ගෙවනු ලබයි. තවද, මෙම ආඥාපණතේ විධිවිධානයන්ට අනුව, කිසියම් විටෙක, ජීවන වියදම් දීමනාව හෝ ජීවන වියදම් දර්ශකය අනුව ගෙවනු ලබන විශේෂ දීමනාව හෝ මෙම පනත යටතේ ගෙවියයුතු දීමනාවන්ගේ එකතුව ඉක්ම වුවහොත්, මෙම අතිරික්තය ලැබීමට සේවකයෝ සුදුස්සෝ වෙති. 1970 පෙබරවාරියේදී, ජීවන වියදම් දර්ශකය ඉහළ යාමේ හේතුවෙන්, තේ වගාව හා නිෂ්පාදනය, රබර් වගාව හා නිෂ්පාදනය පොල් වගාව හා නිෂ්පාදනය, මුද්‍රණ සහ මෝටර් රථ කර්මාන්ත යනාදියේ නියුතු කම්කරුවන්ට ගෙවියයුතු විශේෂ දීමනාව, මෙම ආඥා ත යටතේ ගෙවන ලද දීමනාවට වඩා වැඩි විය.